**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

# ලංසු සඳහා ආරාධනා (IFB)

## බත්තරමුල්ල, "සුහුරුපාය" ගොඩනැගිල්ලේ පද්ධති නඩත්තු කිරීම් සහ සේවා සැපයීම් සඳහා සේවා සපයන්නෙකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදනය

01. මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපතිවරයා, පහත සඳහන් පද්ධති නඩත්තු කිරීම් සහ සේවා සැපයීම් සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවයි.

02. සපයා ගැනීමට නියමිත පද්ධති නඩත්තු කිරීම්, සේවා සැපයීම් සහ අනෙකුත් විස්තර පහත පරිදි වේ:-

| ප්‍රසම්පාදනයේ නම | ලංසු පෝරම ගාස්තුව | ඉදිරිපත් කරන ලංසුවේ වලංගු කාලය | ලංසු ඇපකරයේ වටිනාකම හා වලංගු කාලය | ලංසු භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව | පූර්ව ලංසු රැස්වීමේ දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| බත්තරමුල්ල, "සුහුරුපාය" ගොඩනැගිල්ලේ ශ්‍රව්‍ය විකාශන පද්ධතිය (PA System) නඩත්තු කිරීම සහ සේවා සැපයීම -2027 වර්ෂය සඳහා සේවා සපයන්නෙකු තෝරා ගැනීම.<br><br>IFB No. PS/03/PB/09/35/26 | රු.1,400.00 | 2026.11.25 දින සිට 2027.01.13 දක්වා විය යුතුය. | 2026.11.25 දින සිට 2027.02.10 දක්වා වලංගු රු.20,000/- වටිනා ඇපකරයක් | 2026.11.25 දින පැය 1000 | 2026.11.09 දින පැය 1000 |
| බත්තරමුල්ල, "සුහුරුපාය" ගොඩනැගිල්ලේ CCTV පද්ධතිය නඩත්තු කිරීම සහ සේවා සැපයීම -2027 වර්ෂය සඳහා සේවා සපයන්නෙකු තෝරා ගැනීම.<br><br>IFB No. PS/03/PB/09/26/26 | රු.3,300.00 | 2026.11.25 දින සිට 2027.01.13 දක්වා විය යුතුය. | 2026.11.25 දින සිට 2027.02.10 දක්වා වලංගු රු. 120,000/- වටිනා ඇපකරයක් | 2026.11.25 දින පැය 1100 | 2026.11.09 දින පැය 1100 |

| ප්‍රසම්පාදනයේ නම | ලංසු පෝරම ගාස්තුව | ඉදිරිපත් කරන ලංසුවේ වලංගු කාලය | ලංසු ඇපකරයේ වටිනාකම හා වලංගු කාලය | ලංසු භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව | පූර්ව ලංසු රැස්වීමේ දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| බත්තරමුල්ල, "සුහුරුපාය" ගොඩනැගිල්ලේ ගිනි අනාවරණ පද්ධතිය (Fire Detection) නඩත්තු කිරීම සහ සේවා සැපයීම -2027 වර්ෂය සඳහා සේවා සපයන්නෙකු තෝරා ගැනීම.<br><br>IFB No. PS/03/PB/09/38/26 | රු.2,200.00 | 2026.11.25 දින සිට 2027.02.10 දක්වා විය යුතුය. | 2026.11.25 දින සිට 2027.03.10 දක්වා වලංගු රු. 70,000/- වටිනා ඇපකරයක් | 2026.11.25 දින පැය 1400 | 2026.11.09 දින පැය 1200 |
| බත්තරමුල්ල, "සුහුරුපාය" ගොඩනැගිල්ලේ මධ්‍යම වායු සමීකරණ පද්ධතිය (Central AC) නඩත්තු කිරීම සහ සේවා සැපයීම -2027 වර්ෂය සඳහා සේවා සපයන්නෙකු තෝරා ගැනීම.<br><br>IFB No. PS/03/PB/09/29/26 | රු.2,100.00 | 2026.11.25 දින සිට 2027.01.13 දක්වා විය යුතුය. | 2026.11.25 දින සිට 2027.02.10 දක්වා වලංගු රු. 53,000/- වටිනා ඇපකරයක් | 2026.11.25 දින පැය 1500 | 2026.11.09 දින පැය 1300 |

03. ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (තනි අදියර තනි කවර ලංසු කැඳවීමේ පටිපාටිය) යටතේ සිදු කරනු ලබන අතර අරමුදල් සපයන මූලාශ්‍රය ශ්‍රී ලංකා රජයයි.

04. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන් හට වැඩි විස්තර ප්‍රධාන ගණකාධිකාරි, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, වෙතින් දුරකථන අංක : 0112 887697 / විද්‍යුත් ලිපිනය : mops.procurementunit@gmail.com මගින් ලබා ගැනීමටද, ප්‍රසිද්ධ හා බැංකු නිවාඩු දින හැර සතියේ දින වලදී **2026.11.03 දින සිට 2026.11.23 වන දින දක්වා පැය 0900 සිට පැය 1500** අතර කාලයේ දී මූල්‍ය අංශය, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල හිදී හෝ අපගේ නිල වෙබ් අඩවියෙන් (www.pubsec.gov.lk) ගාස්තු රහිතව ලංසු ලිපි ලේඛන පරීක්ෂා කල හැකිය.

05. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතා සපුරන ලද සියලුම ලංසුකරුවන්ට, අදාල භාණ්ඩ සැපයීමට නෛතික අයිතිය තිබිය යුතුය. ලංසුකරු තම ආයතනය ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචි කර තිබිය යුතු අතර, ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන ලංසුවේ වටිනාකම රු. මිලියන 05 ට වැඩිනම් 1987 අංක 3 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ (Public Contract Act) ලියාපදිංචි වී තිබිය යුතුය. මෙම ලියාපදිංචි සහතිකය ලංසුව සමග ඉදිරිපත් නොකිරීම ලංසුව ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් විය හැක. ලංසුකරුට ලැදියාවන් අතර ගැටුමක් නොතිබිය යුතු අතර ලංසුකරුගේ නම රජයේ අසාදු ලේඛනයේ සඳහන් නොවිය යුතුය. අමතර විස්තර ලංසු ලිපි ලේඛනවල සපයා ඇත.

06. පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත්කර මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද ලංසු ලිපි ලේඛන කට්ටලයක් ඉහත වගුවේ සඳහන් **ආපසු නොගෙවනු ලබන** ලංසු පෝරම ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් **2026.11.03 දින සිට 2026.11.23** වන දින දක්වා රජයේ වැඩ කරන දිනයන්හි **පැය 0900 සිට පැය 1500** දක්වා කාලය තුළ ලබාගත හැක. එක් ආයතනයක් සඳහා එක් ලංසුවකට එක් ලංසු පෝරමයක් පමණක් නිකුත් කරනු ලැබේ.

07. **ඉහත වගුවේ සඳහන් ප්‍රසම්පාදනයන් සඳහා වෙන වෙන ලංසු ඉදිරිපත් කළ යුතු වේ.** ඒ ඒ ප්‍රසම්පාදනයට අදාළව ලංසු පිටපත් දෙකක් සහිතව (මුල් පිටපත / අනුපිටපත) ඉහත වගුවේ සඳහන් **ලංසු භාර ගැනීමේ අවසාන දිනය හා වේලාවට** හෝ ඊට පෙර 17 වන මහල, "සුහුරුපාය", බත්තරමුල්ල ලිපිනයේ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය අංශයේ තබා ඇති ලංසු බහාලනු ලබන ලංසු පෙට්ටියට බහාලීම හෝ ලංසුව විවෘත කරනු ලබන වේලාවට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම් කෙලවර ඉහළ අදාළ ප්‍රසම්පාදනයේ IFB අංකය පැහැදිලිව සටහන් කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද පෞද්ගලිකව පැමිණ සිටීමට රිසි ලංසුකරුවන් හෝ ඔහුගේ නියෝජිතයින් ඉදිරිපිටදී අදාල ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කිරීම සඳහා සහභාගීවන ලංසුකරුවන්ගේ නියෝජිතයින් විසින් ලංසුකරුගේ ලිඛිත අවසරයක් අනිවාර්යෙන්ම රැගෙන ආ යුතුය. ලංසුකරුගේ ලිඛිත අවසරය ඉදිරිපත් කිරීමට අපොහොසත්වන කිසිදු නියෝජිතයෙකු ලංසු විවෘත කිරීම සඳහා සහභාගී කරනු නොලැබේ.

08. ඉදිරිපත් කරනු ලබන ලංසුවල වලංගු කාලය ඉහත වගුවේ සඳහන් පරිදි විය යුතුය.

09. සියලුම ලංසු, ඉහත වගුවේ සඳහන් වටිනාකමින් හා වලංගු කාලයෙන් යුත් ලංසු ඇපකරයක් සමග ඉදිරිපත් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන ඇපකරය පහත කොන්දේසි යටතේ විය යුතුය.
   i. වාණිජ බැංකුවක් ලෙස මහ බැංකුවේ ලියාපදිංචි ආයතනයක් වෙතින් ලබාගත් ඇපකරයක් විය යුතුය.
   ii. ලංසු ඇපකර ආකෘති පත්‍රය ලංසු පෝරම කට්ටලයේ VIII වන කොටසේ ඇතුලත් පෝරමය පරිදි විය යුතුය.
   iii. ලංසු ඇපකරය ලේකම්, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය "Secretary / Ministry of Public Security and Parliamentary Affairs " නමින් විය යුතුය.

10. ඒ ඒ ප්‍රසම්පාදනය සඳහා ඉහත වගුවේ සඳහන් **දින හා වේලාවේදී** පූර්ව ලංසු රැස්වීමක් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, 17 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව දී පැවැත්වෙනු ඇත.

11. කලින් කලට වෙනස් වන මුදල් රෙගුලාසි සහ භාණ්ඩාගාරයේ උපදෙස් චක්‍රලේඛයන්ට අදාලව අවශ්‍ය සංශෝධනයන් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළදී සිදු කිරීම ප්‍රසම්පාදන කමිටුව මගින් සිදුකළ හැකි අතර, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය ලෙසට සැලකිය යුතුය.

12. **<u>ලංසුකරුවන්ගේ විශේෂ අවධානයට</u>**
ලංසු ලේඛන නිකුත් කිරීමේදී ඇතිවන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා පැමිණීමට ප්‍රථම mops.procurementunit@gmail.com විද්‍යුත් ලිපිනයට හෝ ෆැක්ස් අංක 0112887916 වෙත අවශ්‍ය ලංසු ලේඛන පිළිබඳ තොරතුරු යොමුකර පෙර දැනුම්දීමක් සිදුකර පැමිණෙන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

13. පහත සඳහන් ලිපිනය මගින් හෝ දුරකථන අංක මගින් මේ සම්බන්ධව වැඩිදුර විමසීම් සිදුකළ හැක.

| **<u>ලිපිනය</u>** | **<u>දුරකථන අංක</u>** |
|---|---|
| ප්‍රධාන ගණකාධිකාරි,<br>17 වන මහල, "සුහුරුපාය",<br>බත්තරමුල්ල. | සෘජු දුරකථන අංකය :- 011-2887697<br>ෆැක්ස් අංකය :- 011-2887784/2887916 |

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
17 වන මහල, "සුහුරුපාය",
බත්තරමුල්ල.
2026.11.03

**Democratic Socialist Republic of Sri Lanka**
**MINISTRY OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS**

# Invitation for Bids (IFB)

## Procurement for the selection of a service provider for system maintenance and the provision of services at the "Suhurupaya" building in Battaramulla.

1. Chairman, Ministry Procurement Committee (MPC) on behalf of Ministry of Public Security and Parliamentary Affairs invites sealed bids from eligible and qualified bidders to supply following Goods.

| Name of the Procurement | Bid Document Charge | Validity period of the submitted bid | Value and validity period of the Bid Security | Closing date and time for receipt of bids | Date and time of pre-bid meeting |
|---|---|---|---|---|---|
| Selection of a Service Provider for the Service and Maintenance of PA System at "Suhurupaya" Building, Battaramulla for the year 2027<br><br>IFB No. PS/03/PB/09/35/26 | Rs.1,400.00 | It should be from 25.11.2026 to 13.01.2027. | A guarantee worth Rs. 20,000/- valid from 25.11.2026 to 10.02.2027. | On 25.11.2026 at 1000 hrs | On 09.11.2026 at 1000 hrs |
| Selection of a Service Provider for the Service and Maintenance Providing Routine and breakdown maintenance service for the CCTV System at "Suhurupaya" Building, Battaramulla for the year 2027<br><br>IFB No. PS/03/PB/09/26/26 | Rs.3,300.00 | It should be from 25.11.2026 to 13.01.2027. | A guarantee worth Rs. 120,000/- valid from 25.11.2026 to 10.02.2027. | On 25.11.2026 at 1100 hrs | On 09.11.2026 at 1100 hrs |
| Selection of a Service Provider for the Providing Routine and breakdown Maintenance Service for the Fire Detection System at "Suhurupaya" Building, Battaramulla for the year 2027<br><br>IFB No. PS/03/PB/09/38/26 | Rs.2,200.00 | It should be from 25.11.2026 to 10.02.2027. | A guarantee worth Rs. 70,000/- valid from 25.11.2026 to 10.03.2027. | On 25.11.2026 at 1400 hrs | On 09.11.2026 at 1200 hrs |

| Name of the Procurement | Bid Document Charge | Validity period of the submitted bid | Value and validity period of the Bid Security | Closing date and time for receipt of bids | Date and time of pre-bid meeting |
|---|---|---|---|---|---|
| Selection of a Service Provider for the Service and Maintenance Providing Routine and breakdown maintenance service for the Central Air Conditioning System at "Suhurupaya" Building, Battaramulla for the year 2027<br><br>IFB No. PS/03/PB/09/29/26 | Rs.2,100.00 | It should be from 25.11.2026 to 13.01.2027. | A guarantee worth Rs. 53,000/- valid from 25.11.2026 to 10.02.2027. | On 25.11.2026 at 1500 hrs | On 09.11.2026 at 1300 hrs |

2. Bidding will be conducted through National Competitive of Bidding (NCB) method and the source of funding is GOSL.

4. Eligible bidders interested in this regard may obtain further details from Chief Accountant, Ministry of Public Security and Parliamentary Affairs via TP No: 0112 887697 / e-mail : mops.procurementunit@gmail.com or can inspect the bid documents free of charge, from **03.11.2026 to 23.11.2026 between 0900 hrs to 1500 hrs** on weekdays excluding Public and Bank Holidays at Finance Division, Ministry of Public Security and Parliamentary Affairs, 17th Floor, Suhurupaya, Battaramulla, Sri Lanka or through our official website (www.pubsec.gov.lk).

5. All bidders who meet the eligibility requirements must have legal right to supply the relevant Goods. The bidder must have registered his organization as a business, and if the value of the bid submitted by you is more than Rs.5 million it should be registered under the Public Contract Act No. 3 of 1987. Failure to submit this registration certificate with the bid will be grounds for rejection of the bid. The Bidder shall not have a conflict of interest and the name of the bidder should not appear in the Government's blacklist. Additional details in this regard are provided in the Procurement Documents.

6. A set of Procurement Documents prepared in English language can be obtained by the interested bidders by submitting a written application to the address and paying a non-refundable fee of as per above table in cash from **03.11.2026 to 23.11.2026** on Government working days from **0900 hrs to 1500 hrs**. Only one bid form will be issued per bid per organization.

7. **Separate bids must be submitted for the procurements mentioned in the table above**. Bids should be sent in duplicate (Original / Duplicate) and can be deposited in the tender box kept at the Finance Division of Ministry of Public Security and Parliamentary Affairs, 17th Floor, "Suhurupaya", Battaramulla **on or before the date and time specified in the above table** or can be sent via registered post to reach before the above deadline. The bid number should be clearly marked on the top left corner of the envelope. Bids received late will be rejected. Bids will be opened soon after the closing time in the presence of bidders or bidder's representatives. The representatives who will attend on behalf of the bidder should be definitely producing an authorized letter from the organization. Otherwise they will not be allowed for sitting.

8. The validity period of bids submitted shall be as per the above table.

9. All bids must be submitted with a bid security of the value and validity period specified in the table above, and the security submitted must be under the following conditions:

   i. Issued by a Commercial Bank approved by the Central Bank which is operation in Sri Lanka.
   ii. The bid guarantee form shall be in the form contained in Part VIII of the set of bid forms.
   iii. Bid guarantee should be in the name of "Secretary, Ministry of Public Security and Parliamentary Affairs."

10. A Pre-Bid meeting will be held at the Ministry of Public Security and Parliamentary Affairs, 17th Floor, Suhurupaya, Battaramulla, Sri Lanka **on the date and time mentioned in the** table above for each procurement.

11. The procurement committee can make the necessary amendments related to the monetary regulations and treasury instruction circulars that change from time to time during each procurement process, and the decision of the ministry procurement committee should be considered as the final decision.

12. **Special attention to bidders**
    In order to avoid delays in issuing the bidding documents, I kindly request you to give prior notice by sending the required information regarding the bidding documents to mops.procurementunit@gmail.com or fax number 0112887916 before coming.

13. Further inquiries in this regard can be made through the following address or telephone numbers

| **Address** | **Telephone No** |
|---|---|
| Chief Accountant,<br>17th Floor, "Suhurupaya",<br>Battaramulla. | Direct :- 011- 2887697<br>Fax No. :- 011- 2887784/2887916 |

Chairman,
Ministry Procurement Committee,
Ministry of Public Security and Parliamentary Affairs,
17th Floor, "Suhurupaya",,
Battaramulla,
03.11.2026